ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක්</u>

ලංකා විදුලි බල මණ්ඩලයේ නිලධාරීන් 30 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් සූර්ය බලශක්ති ක්ෂේත්‍රයේ විශේෂ පුහුණු සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනකට සහභාගී වීම සඳහා 2026 මාර්තු 09-21 දක්වා ඉන්දීය සංචාරයක නිරත වූහ.

2. ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදී මැතිතුමාගේ 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුර දී ඉන්දියාව විසින් ශ්‍රී ලාංකික වෘත්තිකයන් සඳහා වාර්ෂිකව පුහුණු අවස්ථා 700ක් පිරිනමන බවට නිවේදනය කරන ලද අතර ඒ අනුව මෙම වැඩසටහන සංවිධානය කර තිබිණ.

3. ඉන්දීය රජය විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන දෙසතියක් පුරා නොයිඩා හි NTPC ව්‍යාපාර පාසලේදී පැවැත්විණ. ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන්ට PV තාක්ෂණයන්, බලශක්ති ගබඩා පද්ධතීන්, විදුලිබල ජාල ඒකාබද්ධකරණය, ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම ඇතුළු සූර්ය බලශක්ති අංශයේ ප්‍රධාන පැතිකඩ සම්බන්ධයෙන් ප්‍රායෝගික සහ නවතම දැනුම ලබා දීමේ අරමුණින් මෙම වැඩසටහන සැලසුම් කර තිබිණ.

4. දූත පිරිසට තාප, ගෑස් සහ සූර්ය බලය තුළින් විදුලිය උත්පාදනය කළ හැකි සුවිශේෂී විදුලි බලාගාරයක් වන ඩාඩ්රි විදුලි බලාගාරය සහ ක්ෂුද්‍ර විදුලිබල ජාල පද්ධතියක්, බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් සහ හරිත හයිඩ්‍රජන් නියමු ව්‍යාපෘතීන්වලින් සමන්විත NTPC හි පර්යේෂණ සහ සංවර්ධන අංශය වන NETRA ආයතනය වෙත ක්ෂේත්‍ර චාරිකා හරහා ඉන්දියාව තුළ දැනට පවතින තාක්ෂණයන් සහ නැගී එන නව තාක්ෂණයන් සම්බන්ධයෙන් දැනුම සහ අවබෝධය ද ලබා දෙන ලදී.

5. මෙම වැඩසටහන තුළින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර බලශක්ති ක්ෂේත්‍රය තුළ වෘත්තීය හැකියාවන් ශක්තිමත් කිරීම, දැනුම හුවමාරුව ප්‍රවර්ධනය කිරීම සහ ආයතනික සහ රජය - රජය අතර සබඳතා ගැඹුරු කිරීම සඳහා අර්ථාන්විත දායකත්වයක් ලබා දෙන ලදී.

***

**කොළඹ**
***2026* මාර්තු *26***